ලිංගික අපරාධයක වින්දිතයෙකු බවට පත් වන බාලවයස්කරුවෙකුගේ අනන්‍යතාවය කිසිසේත්ම හෙළිදරව් නොකිරීමට මාධ්‍ය වගබලා ගත යුතු බව මාධ්‍ය ආචාර ධර්මයන්හි තිරව සඳහන් වන කරුණකි. කෙසේ නමුත් එහිදී අදහස් වන්නේ වින්දිත බාලවයස් දරුවාගේ හෝ දැරියගේ නම් සඳහන් කිරීම පමණක් නොවේ. ඉන් එහා ගොස්, වක්‍රාකාරීව බාලවයස් වින්දිතයෙකුගේ අනන්‍යතාවය හෙළිදරව් විය හැකි අවස්ථාවන්ද වළක්වා ලීම සඳහා ආචාර ධර්ම නිර්දේශයන් හඳුන්වා දී තිබේ.

උදාහරණයක් ලෙසින් ගත් විට, ලිංගික අපරාධයකට/අපයෝජනයකට ලක් වන බාලවයස්කාර වින්දිතයෙකු සහ වරදකරු/සැකකරු අතර ඥාති සම්බන්ධතාවයක් පවතින විට, එම සම්බන්ධතාවය සහ වරදකරු/සැකකරු ගේ අනන්‍යතාවය හෙළි කිරීම ඔස්සේ, බාලවයස් වින්දිතයාගේ අනන්‍යතාවයද ඒ තුළින් හෙළිදරව් වීමේ ඉහළ හැකියාවක් තිබේ. මෙය Jigsaw Identification ලෙසින් හැඳින්වේ.

මෙම මාධ්‍ය ආචාර ධර්මය උල්ලංඝනය වීමේ ප්‍රධානතම ගැටළුව වන්නේ වින්දිතයින් වෙත එල්ල වන සමාජ ගර්හාවයි. බාලවයස් වින්දිතයෙකුගේ පාසැල් අධ්‍යාපනය බාධා රහිතව සම්පූර්ණ කරගැනීමටද ඒ ඔස්සේ බාධා එල්ල වීම තවත් ගැටළුවකි. ලිංගික අපරාධයක වින්දිතයෙකු බවට පත් වන බාලවයස්කරුවෙකුගේ අනන්‍යතාවය කිසිසේත්ම හෙළිදරව් නොකිරීමට වගකීමක් මාධ්‍ය අත ඇත්තේ ඒ හෙයිනි.

එම මාධ්‍ය ආචාර ධර්මය උල්ලංඝනය වූ අවස්ථාවක් දිනමිණ (08/27) පුවත් වාර්තාවක දැකිය හැක. එහිදී සැකකරුගේ නම සඳහන් වන අතර, සැකකරු සහ බාලවයස්කාර වින්දිත දැරිය අතර සම්බන්ධතාවයද හෙළිදරව් කොට ඇත. මෙය වගකීම් විරහිත මාධ්‍යකරණයක් සහ මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් බව අපි මෙසේ සටහන් කරමු.

එසේම, ලිංගික අපරාධයක් හෝ අපයෝජනයක් හැඳින්වීමට "දූෂණය" යන යෙදුම භාවිතා නොකරන ලෙසින් අප යෝජනා කරන්නේ, එම යෙදුමෙන් වින්දිතයා අපවිත්‍ර වී ඇති බවක් හැඟවෙන හෙයිනි. එයද ලිංගික අපරාධයක/අපයෝජනයක වින්දිතයෙකුට එල්ල වන සමාජ ගර්හාවට තුඩු නොදෙන්නේ දැයි අප විමසිය යුතුයි.

මූලාශ්‍ර:

https://accountablejournalism.org/.../guidelines-for...
https://www.ipso.co.uk/.../guidance-on-reporting-of.../

**#MediaEthicsSL #lka #sinhalanews #Dinamina**